නිරීක්ෂණ වාර්තා අංක 2

(2018 පෙබරවාරි -20)

## පළාත් පාලන මැතිවරණය -2018 පෙබරවාරි

# මැතිවරණ ක්‍රියාදමය සහ ප්‍රචාරණ ක්‍රියාවලිය ජනමාධ්‍ය විසින් ආවරණය කර ඇති ආකාරය පිළිබඳ දෙවන අතුරු තක්සේරු වාර්තාව

## 01.හැඳින්වීම

2018 පළාත් පාලන මැතිවරණ සමයේ මාධ්‍ය උපමාන හා මාධ්‍ය භාවිතය පිළිබඳව සහ මාධ්‍ය භාවිතය මඟින් මැතිවරණයේදී නිදහස් සහ සියලු සහ සමබර තොරතුරුවලින් දැනුවත් තීරණයක් ගැනීමට ඡන්දදායකයාට ඇති කරන බලපෑම පිළිබඳව මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කෙරෙන අතර අපගේ නිරීක්ෂණ අදාළ බලධාරීන් හා සමාජය හමුවේ ඉදිරිපත් කරමින් ක්‍රියාශීලි සහ ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා වඩාත් වෘත්තීයභාවයෙන් යුත් මාධ්‍ය සංස්කෘතියක් ඇති කරගැනීම සඳහා පුළුල් සංවාදයකට ඉඩ හසර විවර කිරීම අරමුණු කරගත් මෙම අධ්‍යයනය ජනමාධ්‍ය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වන ජාතික ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලදී.

2018 පළාත් පාලන මැතිවරණ සමයේ ජනමාධ්‍ය විසින් සිය කාර්යයන් සහ වගකීම ඉටුකිරීමේදී , ඡන්දදායකයාට සියලු සහ සමස්ත තොරතුරුවලින් දැනුවත්ව නිදහසේ තීරණයක් ගැනීමට හැකි වන පරිදි මාධ්‍ය මඟින් නිවැරදි, අපක්ෂග්‍රාහී සහ සමබර තොරතුරු ඉදිරිපත් කිරීමක් සිදු කරන්නේද, මාධ්‍ය තුළ විවාදයට සහ විධිමත් ගැඹුරු සාකච්ඡාවකට සුදුසු ඉඩ හසරක් ලබාදී තිබේද, මැතිවරණ ආවරණයේදී මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති මාධ්‍ය උපමාන, මාධ්‍යකරණයේ දී ජාත්‍යන්තරව පිළිගත් ආචාරධර්ම හා ප්‍රතිමාන පිළිපැද තිබේද යන්න පිළිබඳව මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරන ලදී.

## 02.ක්‍රමවේදය

ජනමාධ්‍ය අන්තර්ගත විශ්ලේෂණ පර්යේෂණ ක්‍රමවේදය මෙම පර්යේෂණය සඳහා යොදගනු ලැබේ.ඒ අනුව තෝරාගත් නියැදියට අදළව මෙරට පළවන දිනපතා සහ සතිපතා පුවත්පත් සහ විකාශය වන රූපවාහිනී නාලිකාවන්හි අන්තර්ගතය දත්ත වශයෙන් ඒකරාශි කර විශ්ලේෂණය කර ඇත.

ප්‍රවෘත්ති සහ වැඩසටහන් කාලය විනාඩි සහ තත්පරවලින්ද, පුවත්පත් ප්‍රවෘත්ති හා විශේෂාංග අන්තර්ගතය වර්ග සෙ.මී.වලින්ද ගණනය කරමින් දත්ත ඒකරාශි කර ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මැතිවරණ සමයේ ජනමාධ්‍ය භූමිකාව කෙරෙහි අවධානය යොමු කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය උපමාන සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වෘත්තීය ජනමාධ්‍ය ප්‍රමිතීන් මත පිහිටා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක මිශ්‍ර ක්‍රමවේදයක් යොදගනිමින් දත්ත ඒකරාශි කරමින් මෙම වාර්තාව සකසා ඇත.[1]

මෙම දෙවන අතුරු වාර්තාව සඳහා නියැදිය වශයෙන් තෝරාගනු ලැබුවේ **ජනවාරි 23 සිට 31 දක්වා** දින නවය තුළ ***ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, සිරස,ස්වර්ණවාහිනිය, දෙරණ, හිරු*** යන රූපවාහිනි නාලිකා 6 හි රාත්‍රී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයේ(සිංහල) පුවත් අයිතම අන්තර්ගතය, එම නාලිකා මඟින් විකාශය කළ දේශපාලන සාකච්ඡා වැඩසටහන් සහ උදෑසන පුවත්පත් කියවීමේ වැඩසටහන්හි අන්තර්ගතය[2] සහ එම දින නවය තුළ පළවූ ***ලංකාදීප, ඉරිදා ලංකාදීප, දිවයින, දිවයින ඉරිදා සංග්‍රහය, ලක්බිම, ලක්බිම ඉරිදා සංග්‍රහය, මව්බිම, මව්බිම-ඉරිදා, දේශය, රාවය, ලංකා ඉරිදා සංග්‍රහය,දිනමිණ, සිළුමිණ, රැස, අද , ඇත්ත*** සහ ***ඉරිද සියදෙස*** යන දිනපතා සහ සති අන්ත සිංහල පුවත්පත් 19 හි මුල් පිටුවේ පුවත්වල (මුල් පිටුව සහ මුල් පිටුවේ පුවත් ඉතිරිය) අන්තර්ගතයයි. ඒ අනුව ජනවාරි 23 සිට 31 දක්වා දින 9 තුළ අධ්‍යයනයේදී සලකා බැලුණු රූපවාහිනි නාලිකා 6 හි සමස්ත ප්‍රවෘත්ති කාලය **පැය 24 විනාඩි 10** කි. එම දින 9 තුළ පළවූ දිනපතා හා සති අන්ත පුවත්පත් 19 හි නිරීක්ෂණය කළ සමස්ත පුවත් අන්තර්ගතය **98,183 $cm^2$** කි.

---

1 මෙම සමස්ත නිරීක්ෂණයට අදළව 2018 ජනවාරි මස 31 වන දින නිකුත් කරන ලද පළමු අතුරු වාර්තාව වෙත පහත වෙබ් සබඳතාවය ඔස්සේ පිවිසිය හැකිය.
http://www.nsmrlk.org/pdf/Inerium%20media%20monitoring%20report%201%20local%20government%20election%202018.pdf

2 ජාතික රූපවාහිනියේ දේශපාලන සාකච්ඡා සහ පුවත්පත් කියවීමේ වැඩසටහන් සංරක්ෂිත කිරීමෙහි සහ අන්තර්ජාලය ඔස්සේ බාගත කිරීමෙහි ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් ජන.23-31 දක්වා විකාශිත වැඩසටහන් සියල්ලම මෙහිදී නිරීක්ෂණය නොකෙරිණී. එම සියලු වැඩසටහන් දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව පමණක් අවසන් වාර්තාව නිකුත් කෙරෙනු ඇත.

## 03. නිරීක්ෂණ

### 3.1 ප්‍රවෘත්ති අන්තර්ගතය- රූපවාහිනී සහ මුද්‍රිත මාධ්‍ය

මෙහිදී මැතිවරණයට අදළ පුවත් සෘජු සහ වක්‍ර ලෙස වෙන් වෙන්ව නිරීක්ෂණය කළ අතර එම පුවත් ප්‍රධාන දේශපාලන පක්ෂ වෙත ප්‍රවර්ධනාත්මක සහ අවවර්ධනාත්මක ලෙස බලපා ඇති ආකාරයද මෙහිදී නිරීක්ෂණය කර ඇත ***(බලන්න වගු අංක 01).***

| සමස්ත ප්‍රවෘත්ති අන්තර්ගතය ( රූපවාහිනී /මුද්‍රිත) | සමස්ත පුවත් අයිතම සංඛ්‍යාව | මැතිවරණයට අදළ නොවන පුවත් | මැතිවරණයට අදළ පුවත් | | ඒ ඒ දේශපාලන පක්ෂ වෙනුවෙන් වන නියෝජනය | | | | | | | | ඡන්දදායකයා මැතිවරණය පිළිබඳ දැනුවත් කිරීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | එ.ජ.නි.ස | | එ.ජා.ප | | ශ්‍රී.ල.පො.පෙ | | ජ.වි.පෙ | | |
| | | | සෘජු | වක්‍ර | අවවර්ධන | ප්‍රවර්ධන | අවවර්ධන | ප්‍රවර්ධන | අවවර්ධන | ප්‍රවර්ධන | අවවර්ධන | ප්‍රවර්ධන | |
| නිරීක්ෂණය කරන ලද පුවත්පත්වල මුල්පිටු පුවත් | 650 | 181 | 133 | 336 | 56 | 99 | 99 | 76 | 59 | 35 | 4 | 21 | 29 |
| නිරීක්ෂණය කරන ලද විද්‍යුත් මාධ්‍යවල ප්‍රධාන පුවෘත්ති විකාශවල පුවත් | 855 | 175 | 502 | 178 | 08 | 189 | 32 | 183 | 26 | 138 | 0 | 66 | 25 |
| එකතුව | 1505 | 356 | 635 | 514 | 64 | 288 | 131 | 209 | 85 | 173 | 4 | 87 | 19 |

***වගු අංක- 01***

පුවත්පත් මුල්පිටු ප්‍රවෘත්ති සංඛ්‍යාව මෙන්ම රූපවාහිනී ප්‍රවෘත්ති අන්තර්ගතය තුළ මැතිවරණයට සෘජුව සහ වක්‍රව අදළ වන පුවත් ඒ ඒ දේශපාලන පක්ෂ අතර බෙදී ගොස් ඇති ආකාරය නිරීක්ෂණය කරන විට එ.ජ.නි.සයට සහ එ.ජා.ප යට පිළිවෙළින් එම පක්ෂ ප්‍රවර්ධනයට අදළව පුවත් අයිතම 288 ක් සහ 209 ක් බැගින් වෙන්වී ඇති අතර ශ්‍රී.ල.පො.පෙ. සහ ජ.වි.පෙ. යන පක්ෂවලට හිමිව ඇති ප්‍රවර්ධනාත්මක පුවත් අයිතම සංඛ්‍යාව 173ක් සහ 87 ක් බව නිරීක්ෂණය කළ හැකිය. එමෙන්ම එ.ජා.ප. ය වෙනුවෙන් අවවර්ධනාත්මක පුවත් 131ක් වෙන්වී ඇති අතර ශ්‍රී.ල.පො.පෙ.ට 85ක් එ.ජ.නි.ස.යට 64ක්

සහ ජ.වි.පෙ.ට 4ක් වශයෙන් ද අවවර්ධනාත්මක පුවත් වෙන්වී ඇති අන්දම නිරීක්ෂණය කෙරිණ *(බලන්න ප්‍රස්තාර අංක 01).*




***ප්‍රස්තාර අංක 01-පුවත්පත් මුල් පිටු සහ රූපවාහිනී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශවල අන්තර්ගතය (ප්‍රවර්ධනාත්මකව සහ අවවර්ධනාත්මකව) දේශපාලන පක්ෂ අතර බෙදීගොස් ඇති ආකාරය.***

**3.2 ප්‍රවෘත්ති අන්තර්ගතය- දිනපතා සහ සති අන්ත පුවත්පත්**

නිරීක්ෂණය කරන ලද කාලය තුළ පළවූ දිනපතා සහ සති අන්ත පුවත්පත්වල මුල් පිටුවේ පළවූ පුවත් අයිතම සංඛ්‍යාව (මුල් පිටුවෙන් ඇතුළු පිටුවට ඉතිරි සහිතව) 650කි. එයින් 181 ක් මැතිවරණයට අදාළ නොවන පුවත් වන අතර ඍජුව 133ක් සහ වක්‍රව 336ක් වශයෙන් මැතිවරණයට අදළ පුවත් 469ක් නිරීක්ෂණය කරනු ලැබීය . ඒවා ඒ ඒ දේශපාලන පක්ෂ අතර බෙදීගොස් ඇති ආකාරය පහත දැක්වෙන වගු අංක 2 මඟින් නිරූපිතය.

**දිනපතා සහ සති අන්ත පුවත්පත් මුල්පිටුවල මැතිවරණයට අදාළ පුවත් දේශපාලන පක්ෂ අතර බෙදී ගොස් ඇති අයුරු**

| පුවත්පත | මුළු පුවත් | මැතිවරණයට අදාළ නොවන පුවත් | ඍජු | වක්‍ර | එජනිස | | එජාප | | ශ්‍රිලපොපෙ | | ජවිපෙ | | ඡන්දදායකයා දැනුවත් කිරීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ධනාත්මක | ඍණාත්මක | ධනාත්මක | ඍණාත්මක | ධනාත්මක | ඍණාත්මක | ධනාත්මක | ඍණාත්මක | |
| දිනපතා ලංකාදීප | 64 | 21 | 17 | 26 | 7 | 6 | 3 | 5 | 3 | 4 | | | 2 |
| ඉරිදා ලංකාදීප | 9 | | 5 | 4 | 1 | | 2 | 1 | 3 | | | | 1 |
| දිනපතා දිවයින | 86 | 19 | 13 | 54 | 15 | 13 | 7 | 21 | 7 | 8 | 4 | | 4 |
| ඉරිදා දිවයින | 12 | 4 | | 8 | | 2 | | 6 | 1 | | | | 1 |
| ඉරිදා ලක්බිම | 5 | | | 5 | 1 | 2 | 2 | 1 | | | | | |
| දිනපතා ලක්බිම | 64 | 16 | 17 | 31 | 11 | 6 | 8 | 7 | 8 | 4 | 4 | | 7 |
| ඉරිදා රිවිර | 9 | 2 | 3 | 4 | 3 | 1 | 2 | 2 | 1 | | 1 | | 1 |
| රිවිර දිනපතා | 53 | 18 | 9 | 26 | 7 | 4 | 5 | 12 | 4 | 2 | 4 | | 1 |
| දිනපතා මව්බිම | 77 | 24 | 9 | 44 | 8 | 5 | 6 | 15 | 4 | 2 | 4 | 2 | |
| ඉරිදා මව්බිම | 11 | 7 | 3 | 1 | 2 | | | 1 | 1 | | | | |
| දේශය | 9 | 0 | 5 | 4 | 2 | | 1 | 1 | 1 | | 1 | | |
| රාවය | 11 | 4 | 1 | 6 | 1 | 1 | 1 | 2 | | | | | |
| ලංකා | 11 | 3 | | 8 | | 2 | | 3 | | 3 | 2 | | |
| ඇත්ත | 10 | 2 | 3 | 5 | | | | 4 | | | 1 | | |
| දිනමිණ | 83 | 26 | 25 | 32 | 21 | 2 | 22 | 4 | | 16 | | | 4 |
| සිළුමිණ | 12 | 7 | | 5 | 4 | | 4 | | | 1 | | | |
| රැස | 47 | 14 | 6 | 27 | 4 | 7 | 5 | 6 | | 5 | 1 | | 1 |
| අද | 70 | 14 | 14 | 42 | 10 | 5 | 7 | 8 | 2 | 12 | 4 | 2 | 7 |
| සියදෙස ඉරිදා | 7 | | 3 | 4 | 2 | | 1 | | | 2 | | | |
| එකතුව | 650 | 181 | 133 | 336 | 99 | 56 | 76 | 99 | 35 | 59 | 22 | 4 | 29 |

***වගු අංක. 02***

ඉහත වගු අංක 02හි දැක්වෙන නියැදියට අදාළව විශේෂයෙන් දැක්විය යුතු කරුණක් වන්නේ ජනවාරි 29 සහ 30 යන දෙදින තුළ ***රිවිර*** දිනපතා පුවත්පත ප්‍රකාශයට පත් නොවූ බව සහ නිරීක්ෂිත මුල් කාල

පරාසය වන ජනවාරි 20 සිට 22 දක්වා ප්‍රකාශයට පත්ව නිරීක්ෂණයට ලක්කළ ***ජනයුගය*** සහ ***ඉරිද ජනයුගය*** යන පුවත්පත් මෙම දෙවන නිරීක්ෂිත කාලපරාසය තුළ පළ නොවූ බවය.

රූප සටහන් අංක 2 මගින් දැක්වෙන්නේ ඉහත පුවත්පත් 19 හි මුල් පිටුවේ පුවත් අන්තර්ගතය මැතිවරණයට සෘජුව අදළ, වක්‍රව අදළ සහ මැතිවරණයට අදළ නොවන පුවත් ලෙස බෙදීගොස් ඇති ආකාරයයි. ජනවාරි 23 සිට 31 දක්වා කාල සීමාව තුළදී ද පොදුවේ සියලු මුද්‍රිත මාධ්‍යවල මැතිවරණයට අදළ පුවත් වෙනුවෙන් වැඩි ඉඩ ප්‍රමාණයක් (72.1%) වෙන් වී ඇති බව එමගින් නිරීක්ෂණය වේ. එම ප්‍රතිශතය පළමු අතුරු වාර්තාවේ දැක්වෙන ජනවාරි 20-22 දක්වා කාලය තුළ මැතිවරණයට සෘජුව හා වක්‍රව වෙන්කර ඇති පුවත් ඉඩ (65.5%) හා සසඳන විට මැතිවරණ පුවත් සඳහා වන ඉඩ තවදුරටත් වර්ධනය වීමක් බව නිරීක්ෂණය විය.




***රූප සටහන් 01- පුවත්පත් මුල්පිටු පුවත් අන්තර්ගතය මැතිවරණයට සෘජුව /වක්‍රව හා අදළ නොවන පුවත් ලෙස බෙදී ගොස් ඇති ආකාරය***

මුද්‍රිත මාධ්‍ය මුල් පිටුවේ පුවත් අයිතම නිරීක්ෂණය කිරීමේදී ඒ අතර මධ්‍යස්ථ ලෙස වාර්තා කර ඇති පුවත් මෙන්ම දේශපාලන පක්ෂවල ප්‍රතිරූපය ඉහළ නංවන පුවත් (ප්‍රවර්ධනාත්මක) සහ දේශපාලන පක්ෂවල ප්‍රතිරූපයට හානි පමුණුවන ආකාරයෙන් වාර්තාකර ඇති පුවත් (අවවර්ධනාත්මක) ද පවතින බව නිරීක්ෂණය විය.

ප්‍රමාණාත්මකව බැලීමේදී එම පුවත් මගින් ඒ ඒ දේශපාලන පක්ෂවලට නියෝජනයක් හිමිවී තිබුණද ඇතැම් අවස්ථාවලදී එම ඉඩ ප්‍රමාණය වෙන්වී ඇත්තේ පක්ෂ ප්‍රතිරූපය අවවර්ධනය කිරීම සඳහා බව පහත දක්වෙන ප්‍රස්තාර අංක 2 නිරීක්ෂණය කිරීමේදී පෙනී යයි.




***ප්‍රස්තාර අංක 02 : මුල් පිටුවේ ප්‍රවෘත්ති අන්තර්ගතය තුළ ප්‍රවර්ධනාත්මක සහ අවවර්ධනාත්මක පුවත් අයිතම සංඛ්‍යාව***

### 3.3 ප්‍රවෘත්ති අන්තර්ගතය -රූපවාහිනී රාත්‍රී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය

ජනවාරි 23 සිට 31 දක්වා වන නිරීක්ෂණය කරන ලද කාලය තුළ රූපවාහිනී රාත්‍රි ප්‍රධාන විකාශයන්හි විකාශය වූ සමස්ත පුවත් අයිතම සංඛ්‍යාව 855 කි. එයින් 175 ක් මැතිවරණයට අදළ නොවන පුවත් වන අතර ඉන් 502ක්ම ඍජුව මැතිවරණයට අදළ පුවත් වේ. වක්‍රව මැතිවරණයට අදාළ පුවත් සංඛයාව සංඛ්‍යාව 178 කි. ඒ අනුව නිරීක්ෂිත නාලිකා 6හි නිරීක්ෂිත කාලය තුළ ඍජුව සහ වක්‍රව වශයෙන් මැතිවරණයට අදාළව විකාශය වී ඇති පුවත් සංඛ්‍යාව 680 කි. පහත වගුව මගින් දක්වෙන්නේ එම පුවත් අන්තර්ගතය ඒ ඒ දේශපාලන පක්ෂවලට බෙදී ගොස් ඇති ආකාරයයි. මෙහිදී ඒ ඒ පක්ෂ ප්‍රවර්ධනය කරන පුවත් මෙන්ම ඒ ඒ පක්ෂ අවවර්ධනය කෙරෙන පුවත් ලෙසද අදළ පුවත් නිරීක්ෂණය කර තිබේ.

***රූපවාහිනී ප්‍රවෘත්ති අන්තර්ගතය දේශපාලන පක්ෂ අතර සහ ඡන්දදායකයා දැනුම්වත් කිරීමේ පුවත් ලෙස බෙදී ගොස් ඇති ආකාරය***

| නාලිකාව | සමස්ත පුවත් අයිතම සංඛ්‍යාව | මැතිවරණ යට අදාළ නොවන පුවත් | මැතිවරණ යට අදාළ පුවත් | | දේශපාලන පක්ෂය | | | | | | | | | | ඡන්ද දායකයා දැනුම්වත් කිරීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | එ.ජ.නි.ස | | එ.ජා.ප | | ශ්‍රී.ල.පො.පෙ | | ජ.වි.පෙ | | වෙනත් පක්ෂ | | |
| | | | වක්‍ර | ඍජු | අවාසිදායකය | වාසිදායකය | අවාසිදායකය | වාසිදායකය | අවාසිදායකය | වාසිදායකය | අවාසිදායකය | වාසිදායකය | අවාසිදායකය | වාසිදායකය | |
| ජාතික රූපවාහිනීය | 186 | 27 | 24 | 135 | | 45 | | 35 | 6 | 30 | | 19 | | 4 | 4 |
| ස්වාධීන රූපවාහිනිය | 147 | 26 | 36 | 85 | | 39 | | 36 | 7 | 12 | | 10 | | 1 | 6 |
| සිරස | 103 | 15 | 30 | 58 | 1 | 29 | 14 | 19 | 9 | 12 | | 9 | | 1 | 2 |
| ස්වර්ණ වාහිනිය | 144 | 51 | 15 | 78 | | 13 | | 39 | | 17 | | 4 | | | 5 |
| දෙරණ | 147 | 16 | 46 | 85 | 5 | 38 | 14 | 32 | 4 | 30 | | 8 | | 1 | 5 |
| හිරු | 128 | 40 | 27 | 61 | 2 | 25 | 4 | 22 | | 37 | | 16 | | | 3 |
| එකතුව | 855 | 175 | 178 | 502 | 8 | 189 | 32 | 183 | 26 | 138 | 0 | 66 | 0 | 7 | 25 |

***වගු අංක 03***

පහත රූප සටහන් අංක 02 මඟින් නියැදියට අයත් නාලිකා 6 නිරීක්ෂිත දින නවයෙහි රූපවාහිනී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශන තුළ මැතිවරණ සහ සෙසු පුවත් අන්තර්ගතය ප්‍රතිශතයක් ලෙස දක්වා තිබේ. එම කාලසීමාවේදී පොදුවේ රූපවාහිනී නාලිකා ඍජුව හෝ වක්‍රව මැතිවරණයට සම්බන්ධ පුවත් විකාශයට වැඩි ඉඩක් වෙන් කර ඇති බව නිරීක්ෂණය විය. එය මීට පෙර නිකුත් කළ පළමු අතුරු තක්සේරු වාර්තාව  මඟින් ඉදිරිපත් කළ නිරීක්ෂණයෙහිම තවත් දිගුවක් ලෙස පෙන්වා දිය හැකිය.

ජනවාරි 20 සිට 22 දක්වා වූ දින තුනට අදාළ නිරීක්ෂණ ඇතුළත් පළමු අතුරු වාර්තාවට අනුව එම කාලය තුළ රූපවාහිනී පුවත් අන්තර්ගතයෙන් 76.7%ක් සෘජුව හෝ වක්‍රව මැතිවරණයට අදාළ පුවත් වේ. ජනවාරි 23 සිට 31 දක්වා කාලය තුළදී එය 79.54% දක්වා ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය කළ හැකි විණි.




*රූප සටහන් අංක 02- සමස්ත පුවත් අන්තර්ගතය තුළ මැතිවරණ පුවත් බෙදී ගොස් ඇති ආකාරය*

නියැදියට අයත් රූපවාහිනී නාලිකාවන්හි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ තුළ පොදුවේ ඒ ඒ දේශපාලන පක්ෂ වෙනුවෙන් වෙන් කර ඇති පුවත් අයිතම ප්‍රවර්ධනාත්මක පුවත් අයිතම සහ අවවර්ධනාත්මක පුවත් අයිතම වශයෙන් වෙන්වෙන්ව නිරීක්ෂණය කරන ලදී. පහත දැක්වෙන ප්‍රස්තාර අංක 03 මඟින් නිරීක්ෂිත නාලිකා 6 විසින් පොදුවේ සිය රාත්‍රි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය තුළ ඒ ඒ පක්ෂ වෙත වෙන්කර තිබූ ප්‍රවර්ධනාත්මක සහ අවවර්ධනාත්මක ප්‍රවෘත්ති අයිතම සංඛ්‍යාව පහත පරිදි නිරීක්ෂණය කළ හැකිය.




***ප්‍රස්තාර අංක 03: රාත්‍රි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය තුළ ඒ ඒ පක්ෂ වෙත වෙන්කර තිබූ ප්‍රවර්ධනාත්මක සහ අවවර්ධනාත්මක ප්‍රවෘත්ති අයිතම සංඛ්‍යාව***

නියැදියට අයත් රූපවාහිනී නාලිකාවන් 6හි නිරීක්ෂිත දින 9 තුළ ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන්හි පොදුවේ ඒ ඒ දේශපාලන පක්ෂ වෙනුවෙන් වෙන් කර තිබූ  ප්‍රවර්ධනාත්මක පුවත් අයිතම සංඛ්‍යා පහත දැක්වෙන ප්‍රස්තාර අංක 04 මඟින් නිරීක්ෂණය විය.

ඇතැම් නාලිකා සිය දේශපාලන පක්ෂග්‍රාහීත්වය අනුව සමහර දේශපාලන පක්ෂවලට වැඩි කාලයක් වෙන් කරමින් ප්‍රවෘත්ති විකාශයේ අන්තර්ගතය සකසා ඇති බව ප්‍රස්තාර අංක 6 නිරීක්ෂණය කිරීමේදී පෙනීයයි. පොදු දේපළ ලෙස සෘජුවම සැලකෙන රාජ්‍ය නාලිකා දෙකෙහිද මෙම තත්ත්වය එලෙසම නිරීක්ෂණය විණ.




***ප්‍රස්තාර අංක 04- ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන්හි දේශපාලන පක්ෂ වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රවර්ධනාත්මක පුවත් අයිතම සංඛ්‍යාව***

ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන්හි ඒ ඒ දේශපාලන පක්ෂ වෙනුවෙන් වෙන් කර තිබූ අවවර්ධනාත්මක පුවත් අයිතම සංඛ්‍යා පහත ප්‍රස්තාර අංක 05 මගින් නිරූපිත ආකාරයට නිරීක්ෂණය කළ හැකිය.




***ප්‍රස්තාර අංක 05: ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන්හි දේශපාලන පක්ෂ වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රවර්ධනාත්මක පුවත් අයිතම සංඛ්‍යාව***

**3.4 රාජ්‍ය මාධ්‍යවල ප්‍රවෘත්ති අන්තර්ගතය දේශපාලන පක්ෂ අතර බෙදීගොස් ඇති අයුරු- රූපවාහිනී සහ නාලිකා සහ පුවත්පත්**

මෙම අතුරු වාර්තාවට අදළ පර්යේෂණ නියැදිය තුළ රාජ්‍ය මාධ්‍ය වශයෙන් රූපවාහිනී නාලිකා දෙකක් (***ජාතික රූපවාහිනිය*** සහ ***ස්වාධීන රූපවාහිනිය***) සහ දිනපතා සහ සති අන්ත පුවත්පත් 03 ක් (***දිනමිණ, රැස, සිළුමිණ***) හදුනාගත හැකිය. පොදු දේපළ ලෙස සැලකෙන එම මාධ්‍යවල ප්‍රවෘත්ති අන්තර්ගතය මැතිවරණයට තරග කළ ප්‍රධාන දේශපාලන පක්ෂ අතර බෙදීගොස් ඇති ආකාරය පහත වගු අංක 04 සහ රූප සටහන් අංක 03 මගින් නිරූපණය වේ.

| පුවත්පත/ නාලිකාව | මුළු පුවත් | මැතිවරණයට අදළ නොවන පුවත් | සෘජු | වක්‍ර | එජනිස | | එජාප | | ශ්‍රිලපොපෙ | | ජවිපෙ | | ඡන්දදයකයා දැනුවත් කිරීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ධනාත්මක | ඍණාත්මක | ධනාත්මක | ඍණාත්මක | ධනාත්මක | ඍණාත්මක | ධනාත්මක | ඍණාත්මක | |
| ජාතික රූපවාහිනිය | 186 | 27 | 135 | 24 | 45 | | 35 | | 30 | 6 | 19 | | 4 |
| ස්වාධීන රූපවාහිනිය | 147 | 26 | 85 | 36 | 39 | | 36 | | 12 | 7 | 10 | | 6 |
| දිනමිණ | 83 | 26 | 25 | 32 | 21 | 2 | 22 | 4 | | 16 | | | 4 |
| සිළුමිණ | 12 | 7 | | 5 | 4 | 1 | 4 | | | | | | |
| රැස | 47 | 14 | 6 | 27 | 4 | 7 | 5 | 6 | 5 | | 1 | | 1 |
| එකතුව | 475 | 100 | 251 | 124 | 113 | 9 | 102 | 10 | 42 | 35 | 30 | | 15 |

***වගු අංක 04***




*රූප සටහන් අංක 03: රාජ්‍ය මාධ්‍යයන්හි ප්‍රවෘත්ති අන්තර්ගතය දේශපාලන පක්ෂ අතර බෙදී ගොස් ඇති අයුරු*

රාජ්‍ය මාධ්‍ය රූපවාහිනී නාලිකාවල ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය සහ පුවත්පත්වල මුල්පිටුවේ ප්‍රවෘත්ති අන්තර්ගතය පිළිබඳව නිරීක්ෂණය කිරීමේදී පොදු දේපළක් ලෙස සැලකෙන එම නාලිකා සහ පුවත්පත්, මාධ්‍ය උපමානවල සඳහන්වන මධ්‍යස්ථ ,අපක්ෂපාතී සහ සාධාරණ යන ගුණාංග පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැතිබව පෙනීයයි.

ඉහත අංක 4 වගුවේ එ.ජ.නි.ස. හා එ.ජා.ප වෙනුවෙන් ප්‍රවර්ධනාත්මක හා අවවර්ධනාත්මක පුවත් අයිතම එකතුව වෙනුවෙන් පිළිවෙලින් අවස්ථා 122 ක් හා 112 ක් වෙන්වෙද්දී ශ්‍රී.ල.පො.පෙ. හා ජ.විපෙ. වෙනුවෙන් වෙන්වී ඇත්තේ පිළිවෙලින් අවස්ථා 77 ක් හා 29 ක් පමණකි.එම වගුව තවදුරටත් නිරීක්ෂණය කිරීමේදී එම අවස්ථා ප්‍රමාණයෙන් වැඩි බහුතරය වෙන්වී ඇත්තේ රූපවාහිනී නාලිකාවල බවත් ශ්‍රී.ල.පො.පෙ. හා ජ.විපෙ. වෙනුවෙන් රාජ්‍ය මාධ්‍ය පුවත්පත්වල, දින 09ක් තුළ වෙන්වී ඇත්තේ පුවත් අයිතම 23ක් පමණක් බවත් නිරීක්ෂණය වේ.ඒ අතරිනුත් දිනමිණ හා සිළුමිණ පුවත්පත් මුල්පිටුවල මැතිවරණයට අදාළ (ඍජු සහ වක්‍ර ) පුවත් අයිතම 62 ක් , පළකරද්දී ජ.වි.පෙ. වෙනුවෙන් එකම පුවත් අයිතමයක් හෝ වෙන්කර නොමැති බවද ,අදාළ දින 9 තුළ රාජ්‍ය මාධ්‍ය පුවත්පත් මුල්පිටුවේ පුවත් අතර ජ.වි.පෙ. වෙනුවෙන් වෙන්වී ඇති එකම ඉඩ වෙන්කර ඇත්තේ(පුවත් අයිතම 01 ක්) රෑස පුවත්පත පමණක් බවද වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

### 3.5 රූපවාහිනී දේශපාලන සංවාද

පර්යේෂණ නියැදියට අයත් රූපවාහිනී නාලිකා 6 න් නාලිකා 2ක් රාජ්‍ය මාධ්‍ය වන අතර සෙසු රූපවාහිනි නාලිකා 4 පෞද්ගලික මාධ්‍යයට අයත් විය. ඒ අතරින් පෞද්ගලික නාලිකා තුනක සහ එක් රාජ්‍ය මාධ්‍යයක දේශපාලන සංවාද වැඩසටහන් පහක් මෙහිදී නිරීක්ෂණයට ලක් කෙරිණ. ***හිරු , දෙරණ, සිරස*** සහ ***ස්වාධීන රූපවාහිනියේ*** පිළිවෙළින් ***බලය, සළකුණ ,සටන, තීරණය*** සහ ***සංවාදය*** යන වැඩසටහන් අදාළ කාල රාමුව තුළදී එසේ නිරීක්ෂණය විය. මෙහිදී මූලිකව ගුණාත්මක දත්ත රැස් කළ අතර අනතුරුව රැස්කර ගත් දත්ත පහත පරිදි විශ්ලේෂණය කළ හැකිය.

දේශපාලන සංවාද වැඩසටහන්වලදී එය මෙහෙයවන්නා නොඑසේ නම් නිවේදකයා හෙවත් පූරකගේ කාර්යභාරය මූලිකවම වැදගත් වේ. එහිදී ඔහු හෝ ඇය මාධ්‍ය ආචාරධර්ම පිළිපැදීම, අනුග්‍රාහකත්වය, නිගමනාත්මක නොවීම, ,මධ්‍යස්ථභාවය, දේශපාලන ළබැඳියා පවතී ද යන්න, විශේෂඥභාවය, ශරීරභාෂාව හසුරවන ආකාරය, තානය, අදාළත්වය, හරයාත්මක ගැඹුර මෙන්ම විශේෂ සැලකුම් ලබාදෙන්නේද යන්න ද නිරීක්ෂණයට භාජනය කෙරිණ.

එක් වැඩසටහනකදී ස්වාධීන ජනමාධ්‍යවේදීන් ලෙස පෙනී සිටිමින් එම වැඩසටහනට සම්බන්ධ වූ ආයතනය නියෝජනය කරන නිවේදකයන් තිදෙනා සමස්ත වැඩසටහනම එක් දිශාවක් සඳහා යොමුකිරීමට උත්සාහ දරන ආකාරය නිරීක්ෂණය විය. දේශපාලඥයන්ට ඔවුන්ගේ මතය ඉදිරිපත් කිරීමට හෝ අදහස් දැක්වීමට අවස්ථාව ලබාදී එය ප්‍රශ්න කරනු වෙනුවට තමන්ට අවශ්‍ය සහ තමන් විසින් සමාජගත කිරීමට උත්සහ දරන මතයට සරිලන ආකාරයට අදළ පිළිතුරු හෝ අදහස් ලබාගැනීමට එම නිවේදකයන් විසින් කටයුතු කරන අන්දම නිරීක්ෂණය විය. වැඩසටහන් මෙහෙයවීමේදී නිවේදකයා නිසි පරිදි කරුණු වටහාගෙන පැහැදිලිව සිය ප්‍රශ්න ඉදිරිපත් කළ යුතු වුවත් ඇතැම් නිවේදකයන් කිසිදු පිළිගත හැකි මූලාශ්‍රයක් නොදක්වමින් සහ සිය ආධිපත්‍යය සහභාගිවන දේශපාලඥයන් මත යොමු කරමින් තමන්ගේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට උත්සුක වනු නිරීක්ෂණය විය***( බලන්න- පසු සටහන් 1)*** .

නිරීක්ෂිත තවත් එක් අවස්ථාවක, නිවේදක-ආරාධිත ගැටුමක් උත්සන්න වී ආරාධිතයා විසින් ප්‍රධාන නිවේදකයාගේ/තීරකයාගේ සහාය පතනු ලැබිණ. එහිදී එම සංවාදයට එක්ව සිටි පක්ෂ නායකයකු කියා සිටියේ, එම අනවශ්‍ය මැදිහත්වීම 'නිර්දය 'එකක් ලෙස සැලකිය හැකි බවයි(***බලන්න- පසුසටහන් 2).*** එහෙත්, පූර්වෝක්ත නිවේදකයාම මැතිවරණාසන්න කාලසීමාවෙහි ප්‍රධාන පෙළේ දේශපාලන පක්ෂ නායකයන් හා සංවාදයෙහි නිරත වීමේදී අත්‍යවශ්‍ය ප්‍රශ්න විමසීම උවමනාවෙන්ම මග හැරි

බවක් නිරීක්ෂණය විය. එය ආයතනය / නිවේදකයා විසින් අනුගමනය කළයුතු මාධ්‍ය ආචාරධර්මයක් වන අපක්ෂග්‍රාහීත්වයෙන් මිදී,කිසියම් කණ්ඩායමකට විශේෂ සැලකුම් ලබාදීමක් ලෙස නිරීක්ෂණය කළ හැකිය (***බලන්න -පසුසටහන් 3*** ).

දේශපාලන සංවාදවලදී සම්ප්‍රදායක් ලෙස අවසන් වටයේ දී නියෝජිතයන් මතු කරන නව තර්කවලට පිළිතුරු ලබාදීමට අන් අයට -අවස්ථාවක් නොලැබෙන බැවින් එම වටයේදී ප්‍රතිතර්ක මතු කිරීමට අවස්ථාවක් ලබා නොදීම පිළිගත් රීතිය වුවත් අවසාන වටයේ ඇතැම් වැඩටහන් තුළදී මෙම රීතිය නොසලකා හැරීම හේතුවෙන් සමහර පක්ෂ අගතියට පත්වූ බවක් නිරීක්ෂණය විය (***බලන්න- පසුසටහන් 4).***

රාජ්‍ය නාලිකාවල පවා දේශපාලන සංවාදවලට සහභාගී වන දේශපාලන නියෝජිතයන්ට තම අභිමතය පරිදි අදහස් දැක්වීමට මෙහෙයවන්නා විසින් ඉඩ ලබාදීම සාමාන්‍යයෙන් සිදු කෙරෙන බව නිරීක්ෂණය කළ හැකිවිය. කෙසේවෙතත් ඇතැම් අවස්ථාවලදී රාජ්‍ය අංශයේ නාලිකා විසින් පාලක පක්ෂයේ අපේක්ෂක/අපේක්ෂිකාවන්ට විශේෂ සැලකිලි දක්වන අවස්ථාද නිරීක්ෂණය විණි (***බලන්න- පසුසටහන් 5).***

දේශපාලන සංවාදවලදී මේ අන්දමට නිවේදක හැසිරීම සහ ආයතන න්‍යාය පත්‍ර පදනම් කරගෙන ලද දත්ත පදනම් කරගත් විශේෂ නිරීක්ෂණ හඳුනාගත හැකි වුවද, පොදුවේ ගත් කල ,රාජ්‍ය නාලිකාවද ඇතුළුව නිරීක්ෂිත නාලිකා හතරෙහිම දේශපාලන සංවාදවලදී ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේද දේශපාලන පක්ෂවලට සමානව අවස්ථා ලබාදීමට සහ ඉඩ වෙන්කිරීමට කටයුතු කරන බව නිරීක්ෂණය කළ හැකිවිය. විශේෂයෙන් නිරීක්ෂිත රාජ්‍ය නාලිකාවෙහි විරුද්ධ පක්ෂ නායකයන් වෙත සම්පූර්ණ දේශපාලන වැඩසටහන් පවා ලබා දෙනු නිරීක්ෂණය කළ හැකිවිය(***බලන්න- පසුසටහන් 6).***

### 3.6 රූපවාහිනී පුවත්පත් තොරතුරු ඉදිරිපත් කිරීමේ වැඩසටහන්

පර්යේෂණ නියැදියට අයත් රූපවාහිනී නාලිකා 6 න් 4 ක් විසින් දිනපතා සහ ඉරිදා පුවත්පත්වල තොරතුරු ඉදිරිපත් කිරීමේ වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ. උදෑසන පවත්වාගෙන යන මෙම වැඩසටහන් ***ජාතික රූපවාහිනියේ අද සිවුදෙස විමසුම, හිරු*** නාලිකාවේ ***පත්තරේ විස්තරේ, දෙරණ*** නාලිකාවේ ***දෙරණ අරුණ*** සහ ***ස්වර්ණවාහිනියේ අද දවස*** ලෙස නිරීක්ෂණය කෙරිණ.

අදාළ කාලසීමාව තුළ මෙම නාලිකා හතරේම ඉහත සඳහන් කළ වැඩසටහන් හතරම නිරීක්ෂණය කරනු ලැබූ අතර එහිදී මූලිකව අවධානය යොමු කරනු ලැබුවේ ගුණාත්මක දත්ත රැස්කිරීම කෙරෙහිය. එහිදී සපයා ගන්නා ලද දත්ත පහත පරිදි විශ්ලේෂණය කළ හැකිය.

මෙම නිරීක්ෂණයේදී ද මූලිකව අවධානය යොමු කරනු ලැබුවේ නිවේදක හැසිරීම, පුවත්පත් සහ ඒවායේ ඇති පුවත් තෝරා ගැනීම, එහිදී කිසියම් න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක වන්නේද යන කරුණු කෙරෙහිය.

***ජාතික රූපවාහිනියේ අද සිවුදෙස විමසුම*** පිළිබඳ නිරීක්ෂණය කරන විට පැහැදිලිව හඳුනාගත හැකි කරුණක් වූයේ එහි පුවත්පත් තෝරාගැනීම සහ එයින් පුවත් තෝරාගැනීම පමණක් නොව ඒවා ඉදිරිපත් කිරීම ආදි සියල්ල සිදුවන්නේ කිසියම් දේශපාලන න්‍යායපත්‍රයකට පක්ෂග්‍රාහී ආකාරයකට බවයි. එහිදී විපක්ෂයේ ඇතැම් දේශපාලන පක්ෂවල ප්‍රවෘත්තිවලට යම් අවස්ථාවක් ලබාදුන්නද එමඟින්ද පූර්වෝක්ත දේශපාලන න්‍යාය පත්‍රය ඉස්මතු කරන ආකාරයක් නිරීක්ෂණය කළ හැකිවිය. එමෙන්ම පුවත්වලට අදාළව වැඩිදුර තොරතුරු ගෙන ඒමේදී විවිධ රූපමය වාර්තා, රැස්වීම් වාර්තා වැනි වාර්තා ඉදිරිපත් කළ අතර ඒ සියල්ල තුළ ආණ්ඩුව නියෝජනය කරන පක්ෂවලට උපරිම අවස්ථා හිමිවූ අතර විරුද්ධ පක්ෂවලට හිමිවූයේ අවම ඉඩකි***(බලන්න- පසුසටහන් 7).***

***හිරු*** නාලිකාවේ ***පත්තරේ විස්තරේ*** වැඩසටහන බැලූ බැල්මට නිරීක්ෂණය වන්නේ සියලුම පුවත්පත් තෝරා ගන්නා එහිදීද එදිනෙදා තත්ත්වයන්ට අනුව වැදගත්වන පුවත් සියල්ලම පාහේ තෝරා ගන්නා වැඩසටහනක් වශයෙනි. එසේ වුවද,බොහෝ අවස්ථාවලදී තෝරා ගන්නේ එකම පුවත්පත් පමණක් බවත් ඇතැම් පුවත්පත් තෝරා ගැනීම ඉතා අවම බවත් නිරීක්ෂණය විය. එමෙන්ම, ප්‍රවෘත්ති තෝරාගැනීම තුළ ද ඇතැම් දේශපාලන පක්ෂවලට බලපෑම් කරන පුවත්වලට වැඩි අවධානයක් යොමු කරන බව නිරීක්ෂණය කළ හැකි විය. එමෙන්ම මෙම වැඩසටහන තුළදී නිවේදකයා විසින් ඇතැම් පුවත් ඉදිරිපත් කිරීමේදී සිය මතය විශේෂයෙන් පුවත්පත් කාටුන් ඉදිරිපත් කිරීමේදී සිය මතය ද දැක්වීමට උත්සහ කරන බව නිරීක්ෂණය විය***(බලන්න- පසුසටහන් 8).***

***ස්වර්ණවාහිනී*** නාලිකාවේ පුවත්පත් තොරතුරු ඉදිරිපත් කිරීමේ වැඩසටහන වන ***අද දවස*** තුළ හඳුනාගත් පොදු නිරීක්ෂණයක් වන්නේ සීමිත පුවත්පත් සංඛ්‍යාවක් සහ පුවත් සංඛ්‍යාවක් පමණක් තෝරා ගැනීමයි. කෙසේවෙතත් මෙම වැඩසටහන තුළදී මැතිවරණට සෘජුව හෝ වක්‍රව අදාළ වන පුවත් මෙන්ම මැතිවරණයට අදාළ නොවන පුවත්ද තෝරා ගැනීමට උත්සුක වන බවක් ද නිරීක්ෂණය විය. එමෙන්ම මෙහිදී නිරීක්ෂණය වූ තවත් විශේෂ කරුණක් වන්නේ පුවත් තෝරා ගැනීමේදී සියලු

පක්ෂ නියෝජනය වන පරිදි පුවත් තෝරාගෙන ඉදිරිපත් කිරීමයි. නිවේදක හැසිරීම නිගමනාත්මක බවින් අවම වන බවත් හුදු පුවත ඉදිරිපත් කිරීමට පමණක් සීමාවූ බවත් නිරීක්ෂණය කළ හැකිවිය***(බලන්න- පසුසටහන් 9).***

නිරීක්ෂණයට ලක්වූ අනෙක් පුවත් පත් තොරතුරු ඉදිරිපත් කිරීමේ වැඩසටහන වන්නේ ***දෙරණ*** නාලිකාවෙන් විකාශය වන ***දෙරණ අරුණයි.*** පුවත්පත් හා ප්‍රවෘත්ති තෝරා ගැනීමේදී මෙම වැඩසටහන තුළ සෑමවිටම සෑම පුවත්පතක්ම පාහේ, සෑම පුවතක්ම පාහේ ඉදිරිපත් කිරීමට උත්සාහ දරන බව නිරීක්ෂණය විණි. කෙසේවෙතත් තවදුරටත් නිරීක්ෂණය කළ හැකිවූයේ සමාජයේ ආන්දෝලනාත්මක සහ දේශපාලන වශයෙන් ප්‍රබල බලපෑම් ඇති කරන පුවත් වඩාත් පුළුල්ව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවයි***(බලන්න- පසුසටහන් 10).***

එමෙන්ම මෙහිදී පුවත් විශේෂයෙන් කාටුන් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්ද විශේෂ කරුණු කිහිපයක් නිරීක්ෂණය කළ හැකි විය.ඇතැම් පුවත් මධ්‍යස්ථව නිගමනවලින් තොරව ඉදිරිපත් කිරීම නිරීක්ෂණය කළ හැකි වුවත් ඇතැම් පුවත් ඉදිරිපත් කිරීමේදී නිවේදක අදහස් දැක්වීම් සහ නිගමන ඉදිරිපත් කිරීම වැනි කරුණු නිරීක්ෂණය කළ හැකි විය***(බලන්න- පසුසටහන් 11).***

**මාධ්‍ය උපමාන හා මාධ්‍ය භාවිතය පිළිබඳව  පොදු නිරීක්ෂණ**

ජනවාරි මස 20- 22 දක්වා කාලය තුළ රූපවාහිනි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ සහ  පුවත්පත් මුල් පිටු ප්‍රවෘත්ති අන්තර්ගතය විශ්ලේෂණය කර 2017 ජනවාරි 31 වන දින අප විසින් එළිදක්වන ලද පළමු අතුරු වාර්තාව මඟින් මූලිකව එළඹි නිගමනය වූයේ,  2017 දෙසැම්බර් 04, අංක 2048/1 දරන අතිවිශේෂ  ගැසට් පත්‍රය මඟින් මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවා ඇති මාධ්‍ය උපමාන  පිළිබඳව පොදුවේ රූපවාහිනී හා මුද්‍රිත දෙඅංශයම ප්‍රමාණවත් අවධානයක් දක්වා නොමැති බවයි.

කාල රාමුව (ජනවාරි 23- 31) දක්වාද  රූපවාහිනි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ සහ  පුවත්පත් මුල් පිටු ප්‍රවෘත්ති අන්තර්ගතයට අමතරව රූපවාහිනී දේශපාලන සංවාද සහ රූපවාහිනි නාලිකා මඟින් පුවත්පත් තොරතුරු ඉදිරිපත් කිරීමේ වැඩසටහන් ද වශයෙන්  නිරීක්ෂණ පරාසය තවදුරටත්  පුළුල් කරනු ලැබ මෙම දෙවන අතුරු වාර්තාව එළිදක්වා ඇති අතර, එහිදී ද

පොදුවේ රූපවාහිනී හා මුද්‍රිත දෙඅංශයම මාධ්‍ය උපමාන පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් දක්වා නොමැති බව මූලිකව නිරීක්ෂණය විණි.

(1) පළමු මාධ්‍ය උපමානය වන්නේ ***සෑම මාධ්‍යය ආයතනයක්ම සිය ප්‍රවෘත්ති සංග්‍රහය සහ දේශපාලන කටයුතු සහ සම්බන්ධ වෙනත් වැඩසටහන් ප්‍රචාරය හෝ විකාශය කිරීමේදී නිවැරදි, සමතුලිත සහ අපක්ෂපාතී තොරතුරු ලබාදිය යුතුය*** යන්නයි. එසේ වුවද රූපවාහිනී ප්‍රවෘත්ති විකාශ සහ පුවත්පත් මුල්පිටු නිරීක්ෂණයේදී පැහැදිලිව හඳුනාගත හැකි වූයේ බොහෝ නාලිකා මෙන්ම බොහෝ පුවත්පත් ද සමතුලිත සහ අපක්ෂපාත තොරතුරු වෙනුවට තම දේශපාලන න්‍යාය පත්‍රයට අනුව යමින් අසමතුලිත සහ පක්ෂග්‍රාහී වාර්තාකරණයක නිරත වී ඇති බවයි ***(බලන්න- පසුසටහන් 12).***

(2) දෙවන මාධ්‍ය උපමානය වන්නේ සෑම මාධ්‍යයක්ම මැතිවරණයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී ***සෑම පක්ෂයකටම හෝ අපේක්ෂකයකුටම අසාධාරණයක් හා විශේෂ වාසියක් ඇති නොවන පරිදි*** කටයුතු කළ යුතු බවයි. එහෙත් මෙම උපමානය බරපතළ ලෙස උල්ලංඝනය කරමින් ඒ ඒ මාධ්‍ය විසින් විවිධ පක්ෂ ප්‍රවර්ධනයට සහ අවවර්ධනයට කටයුතු කර ඇති අන්දම පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි විය. ***(බලන්න- පසුසටහන් 13)***

03. මැතිවරණ කොමිසම මඟින් නිකුත් කර ඇති උපමාන අතර සිව්වැන්න වන්නේ ***රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකාවක වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන හෝ නිවේදනය කරනු ලබන සෑම තැනැත්තකුම , පුවත්පත් වැඩසටහන්වලදී පුවත්පත් සිරස්තල සහ කාටූන් ඉදිරිපත් කිරීමේදී එක් පාර්ශ්වයක් ප්‍රවර්ධනය කරන හෝ තවත් පාර්ශවයකට අගතියක් ගෙන දෙන අයුරින් සිය පුද්ගලික අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකිය යුතු*** වන බවයි. එසේ වුවද මෙම උපමානය නොතකා කටයුතු කරන අවස්ථා රැසක්ම මෙම නිරීක්ෂණය තුළදී හඳුනාගත හැකිවිය. ***(බලන්න- පසුසටහන් 14)***

04. උපමාන අතරින් හයවැන්න වන්නේ යම් සිද්ධියක් හෝ සිදුවීමක් ආවරණය කරමින් ඒ පිළිබඳව ***එක් අපේක්ෂකයෙකු විසින් සිදුකරන අදහස් දැක්වීම් සහිතව ප්‍රචාරය කිරීමේදී විකාශය කිරීමේදී හෝ පළ කිරීමේදී එම සිද්ධිය ගැන උනන්දුවක් දක්වන හෝ සැළකිල්ලක් දක්වන හෝ එම කරුණු මගින් බලපෑමට ලක්විය හැකි වෙනත් යම් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද එම සිද්ධිය හෝ සිදුවීම පිළිබඳව සිය අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය*** යන්නයි. මෙම උපමානය බිඳදමමින් කටයුතු කළ අවස්ථා රැසක් මෙහිදී නිරීක්ෂණය විය.***(බලන්න- පසුසටහන් 15)***

05. ***යම් අපේෂකයෙකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයෙකු හට අගතියක් වන අයුරින් යම් අපේක්ෂකයෙකු වෙත විශේෂ හා වාසිදයක සැලකිල්ලක් දක්වා ගුවන් කාලය හෝ ප්‍රවෘත්ති පත්‍ර ඉඩකඩ වෙන් කිරීම නොකළ යුතුය*** යන්න උපමානයන්ගේ 11 වැන්නයි. එම උපමානයද බරපතළ ලෙස කඩ කර ඇති අවස්ථා නිරීක්ෂණය විණ***(බලන්න- පසුසටහන් 16).***

06. මෙම මාධ්‍ය උපමානයන් අතරේ 27 වැන්න වන්නේ ***මාධ්‍ය ආචාර ධර්මවලට අනුකූලවීම සහ ඒවායින් බැඳී ක්‍රියා කිරීම සහ සෑම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනයකම වගකීම*** බවයි. එම උපමානය පොදුවේ උල්ලංඝනය වන අවස්ථා රැසක් ද නිරීක්ෂණය විය***(බලන්න- පසුසටහන් 17).***

07. මෙම මාධ්‍ය උපමානයන් උල්ලංඝනය කිරීම රාජ්‍ය මාධ්‍යවලදී සුවිශේෂී හැඩතල ඔස්සේ හඳුනාගැනීමට හැකිවූ අතර පෞද්ගලික නාලිකා තුළින් ද වෙනස් හැඩතල් ඔස්සේ හඳුනාගැනීමට හැකිවීම මෙහිදී දැකගත හැකිවූ විශේෂ නිරීක්ෂණයකි***(බලන්න- පසුසටහන් 18).***

08. මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම මාධ්‍ය උපමාන පනවා ඇත්තේ නිදහස් මැතිවරණයක් සහතික කිරීම සඳහා වන අතර ජනමාධ්‍ය විසින් එම උපමාන උලලංඝනය කිරීම මඟින් ඡන්දදායකයාගේ නිදහස් ඡන්ද අයිතියට අගතියක් සිදුවන බැවින් රජය, ජනමාධ්‍ය හිමිකරුවන්, ජනමාධ්‍යවේදීන්, පුරවැසියන් ඇතුළු සියලු පාර්ශව මෙම තත්ත්වය මෙම තත්ත්වය වළක්වා ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතුය.

## පසු සටහන්

01. 2018/01/23 දින ***සිරස සටන*** වැඩසටහනේදී ස්වාධීන මාධ්‍යවේදියෙකු ලෙස ඊට සම්බන්ධ වූ ජේ.ශ්‍රී රංගා කටයුතු කළේ තමන්ට අවශ්‍ය අදහස් සහභාගී වූ ආරාධිතයන්ගෙන් ප්‍රකාශ කරවා ගන්නා අන්දමකිනි. ජ.වි.පෙ මන්ත්‍රී නලින්ද ජයතිස්සට සිදුවූයේ නිවේදකයාට සිය මතය ප්‍රකාශ කිරීමට අවශ්‍ය තොරතුරු ප්‍රකාශ කිරීමටය. 2018/01/30 ***සටන*** වැඩසටහනේදී ද මෙම තත්ත්වය නිරීක්ෂණය කළ හැකි විය. මෙහිදී නිවේදකයන් කටයුතු කළේ සිය ආයතනික න්‍යාය පත්‍රයට අනුකූලව ආරාධිතයන්ගෙන් අදහස් ලබා ගනිමින් වැඩසටහන ඉදිරියට රැගෙන යාමට වන අතර මෙය සහභාගී වන්නන්ට සිය අදහස් නිදහසේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදෙන තත්ත්වයක් ලෙසට නිරීක්ෂණය විය.

02.***හිරු*** නාලිකාවේ 2018/01/22 පැවති ***සලකුණ*** දේශපාලන සංවාද වැඩසටහනේදී ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුරකුමාර දිසානායක විසින් මෙම කරුණ මතු කරනු ලැබිණ.

03. ***හිරු*** නාලිකාවේ 2018/01/29 පැවති ***සලකුණ*** දේශපාලන සංවාද වැඩසටහනේදී මහින්ද රාජපක්ෂ සහභාගි වූ අවස්ථාවේ මෙම තත්ත්වය නිරීක්ෂණය කිරීමට හැකිවිණ.

04. ***දෙරණ*** නාලිකාවේ ***වාදපිටිය*** -2018/01/30 බිමල් රත්නායක, මනුෂ නානායක්කාර, නලින් බණ්ඩාර සහ රොෂාන් රණසිංහ යන මන්ත්‍රීවරුන් සහභාගි වූ වැඩසටහනේදී මෙම තත්ත්වය නිරීක්ෂණය කළ හැකි විය.

05. ***ස්වාධීන රූපවාහිනී සේවයේ*** 2018/01/25 දින විකාශය වූ ***තීරණය*** දේශපාලන සංවාද වැඩසටහනේදී මෙහෙවන්නා සහභාගීවන්නන්ට සිය අභිමතය පරිදි රිසිසේ අදහස් දැක්වීමට ඉඩ ලබාදුන් බව නිරීක්ෂණය කළ හැකි වූ අතර මෙහෙයවන්නා මතු කරන ප්‍රශ්න සඳහා සෘජු පිළිතුරු ලබාදීමක් නිරීක්ෂණය කළ නොහැකි විණි.

06. නිරීක්ෂිත වැඩසටහන්වලදී සියලු පක්ෂවලට නාමිකව හෝ අදහස් දැක්වීමට අවස්ථාව හිමිවූ අතර 2018/01/23 ***ස්වාධීන රූපවාහිනියේ*** සංවාදය වැඩසටහනට ***බැසිල් රාජපක්ෂ*** පවා සම්බන්ධ කර ගෙන තිබිණ.

07. 2018/01/30 දින ***ජාතික රූපවාහිනියේ අද සිවුදෙස විමසුම*** වැඩසටහන ඉදිරිපත් කිරීමේදී ඒ ඒ පක්ෂවලට අදළ පුවත් තෝරාගෙන ඒවා ඉදිරිපත් කෙරෙන අතර ඊට සමගාමීව ඒ ඒ දේශපාලන පක්ෂවල රැස්වීම් වාර්තා ද ඉදිරිපත් කළ අතර එහිදී එක්සත් ජනතා නිදහස් සන්ධානයට හා එක්සත් ජාතික පක්ෂයට වැඩි ඉඩකඩක් වෙන් වූ අතර ජනතා විමුක්ති පෙරමුණට හිමිවූයේ සාපේක්ෂව අඩු ඉඩකඩකි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට හිමිවූයේ තවදුරටත් අඩු ඉඩ ප්‍රමාණයකි.

08. නිරීක්ෂිත කාල සීමාව තුළ දී ***හිරු පත්තරේ විස්තරේ*** වැඩසටහන තුළ ***දිනමිණ*** හෝ ***සිළුමිණ*** පුවත්පත්වලින් පුවත් තෝරා ගැනීම නිරීක්ෂණය නොවූ අතර අර්බුදයන්ට අදළ පුවත් එනම් බැඳුම්කර සිදුවීම, ඌව ප්‍රධාන අමාත්‍යවරයා ගුරුවරියක දණ ගැස්සූ බව කියන සිදුවීම වැනි සිදුවීම්වලට අදළ පුවත් සෑම පුවත්පතක්ම පාහේ උපුටා දක්වමින් නිවේදකයා සිය මතය ද දක්වමින් ඉදිරිපත් කරනු නිරීක්ෂණය කළ හැකිවිය.

09. ***ස්වර්ණවාහිනී*** නාලිකාවේ ***අද දවස*** වැඩසටහනේදී දේශපාලනයට හෝ මැතිවරණයට අදළ පුවත් පමණක් නොව සෙසු පුවත් ද තෝරා ගනිමින් සමබරව කටයුතු කරන අන්දම නිරීක්ෂණය කළ හැකි විය. තෝරා ගන්නා පුවත් සංඛ්‍යාව අවම වුවද (උදා- 2018/01/29 දින තෝරාගත් පුවත් සංඛ්‍යාව 07කි) එහි සියලු පක්ෂවලට නියෝජනය ලැබීමත් අවශේෂ සිදුවීම් වාර්තාකරණයත් නිරීක්ෂණය කළ හැකිවිය.සියලු දිනවල නිවේදක නිගමන හඳුනාගත නොහැකි තරම් විය.

10. ***දෙරණ*** නාලිකාවේ 2018/01/ 25 දින ***දෙරණ අරුණ*** වැඩසටහනේදී පුවත්පත් පුවත් 14 ක් ඉදිරිපත් කරනු ලැබිණ. ඉන් පුවත් 11 ක්ම බැඳුම්කර සිදුවීම සහ ඒ මත ගොඩනැගුණු පුවත් ලෙස නිරීක්ෂණය විය.

11. ***දෙරණ අරුණ*** පුවත්පත් ඉදිරිපත් කිරීමේ නිවේදක මතය ඉදිරිපත් කිරීම නිරීක්ෂිත බොහෝ අවස්ථාවල දැකගත හැකි විය. ***ලංකාදීප*** සහ **දිවයින** පුවත්පත්වල කාටුන් ඉදිරිපත් කිරීමේදී නිවේදක මතය ඉදිරිපත් කරන අවස්ථාද සුලබව නිරීක්ෂණය විය.

12. වගු අංක 1 සහ ප්‍රස්තාර අංක 1 මඟින් ඇතැම් පක්ෂවලට ප්‍රවර්ධනාත්මක පුවත් බහුලව හා අවවර්ධනාත්මක පුවත් අවම වශයෙන්ද ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

13. අසාධාරණ සහ විශේෂ වාසි සැලසීමට අදාළ නිරීක්ෂණයන් පසු සටහන් 11 තුළින්ද හඳුනාගත හැකි අතර තවදුරටත් සඳහන් කළ හැක්කේ වගු අංක 02, ප්‍රස්තාර අංක 6 , 7 ආදිය මඟින්ද අසාධාරණ සහ විශේෂ වාසි සැලසීම් නිරීක්ෂණය කළ හැකි බවයි. ඒවාට අනුව රාජ්‍ය මාධ්‍ය එනම් ***ජාතික*** හා ***ස්වාධීන රූපවාහිනී*** සේවා මෙන්ම ලේක්හවුස් ***(දිනමිණ,සිළුමිණ*** සහ ***රැස***)පුවත්පත් එ.ජ.නි.සයට සහ එ.ජාප.යට අසාධාරණ ලෙස විශේෂ වාසි සලසා ඇති අතර ***සිරස*** එ.ජා.ප.යට අවම වාසි සහ එ.ජ.නි.ස.යට වාසි සහගත තත්ත්වයක් සකසා දී ඇති බවත්,***ස්වර්ණවාහිනිය*** එ.ජා.ප යට වාසි සලසා ඇති බව ඒ ඒ පක්ෂවලට ප්‍රවර්ධනාත්මක පුවත් අනෙක් පක්ෂවලට වඩා වැඩි වශයෙන් ලබාදීමෙන් නිරීක්ෂණය විය.

14. ***හිරු පත්තරේ විස්තරේ*** සහ ***දෙරණ අරුණ*** වැඩසටහන්වලදී අදාළ නිවේදකයන් පුවත්පත් කාටුන් ඉදිරිපත් කිරීමේදී සිය මත දැක්වීම් සිදුකිරීම බහුලව නිරීක්ෂණය විය.

15. ඇතැම් පළාත්පාලන අපේක්ෂකයන් හරහා විවිධ ප්‍රාදේශිය සහ ඇතැම් ජාතික දේශපාලන කරුණු(උදා විදුහල්පතිනිය දණ ගැස්වූ බව කියන සිදුවීම, බැඳුම්කර ගැටලුව) පිළිබඳ අදහස් ලබා ගනිමින් අදළ ප්‍රදේශවලට තරග කරන සෙසු පක්ෂවල අපේක්ෂකයන්ගෙන් ඒ පිළිබඳව කිසිදු අදහසක් ලබා නොගනිමින් කටයුතු කරන අවස්ථා රැසක් හඳුනාගත හැකිවිය. ***දිවයින, දිනමිණ*** පුවත්පත්වල මෙම තත්ත්වය බහුලව හඳුනාගැනීමට හැකිවූ අතර ***සිරස*** නාලිකාවද තෝරාගත් අපේක්ෂකයන්ගෙන් පමණක් එවැනි අදහස් දැක්වීම් ඉදිරිපත් කරන ආකාරය නිරීක්ෂණය විය.

16. වගු අංක 2 සහ 3 ප්‍රස්තාර අංක 6 සහ 7 පුවත්පත් සහ රූපවාහිනී නාලිකා ඒ ඒ පක්ෂ සහ ඒවායේ අපේක්ෂයන් වෙත දක්වා ඇති විශේෂ සහ වාසිදයක සැලකිලි නිරීක්ෂණය වේ. ඊට අතිරේකව **සිරස** නාලිකාව තෝරාගත් අපේක්ෂකයන් විශේෂයෙන් ප්‍රවර්ධනය කළ අතර ***එ.ජ.නි.ස*** කොළඹ පුරපති අපේක්ෂක අසාද් සාලි එහිදී කැපී පෙනිණි.

17.මාධ්‍ය ආචාර ධර්මවල මූලික හරය වන්නේ නිවැරදි, අපක්ෂපාත, සමතුලිත, සමබර වාර්තාකරණයයි. නිරීක්ෂිත නාලිකා එය උල්ලංඝනය කර ඇති අන්දම ඉහත පසුසටහන් සියල්ල මඟින් ද විශේෂයෙන් වගු අංක 1, 2 සහ 3 ප්‍රස්තාර අංක 1,6 සහ 7 තුළින් ද පෙන්වා දී තිබේ.

18. රාජ්‍ය රූපවාහිනී නාලිකා (***ජාතික,ස්වාධීන***) පුවත්පත් (***දිනමිණ, ලේක්හවුස්, රැස***) එ.ජ.නි. ස සහ එ.ජා.ප වෙනුවෙන් වැඩි අවස්ථා සලසමින්ද ශ්‍රී.ල.පො.පෙ වෙත අවම අවස්ථාද ජ.වි.පෙ වෙත ඉතා අවම අවස්ථාද (ලේක්හවුස් පුවත්පත්වල අදාළ කාලසීමාවේ ජ.වි.පෙ වර්ධනාත්මක පුවත් 1ක් පමණි) සලසමින් කටයුතු කර ඇත. ***සිරස*** නාලිකාව එ.ජ.නි. ස ට සහ ජනාධිපතිවරයාට පුළුල්ව වර්ධනාත්මක අවස්ථා ලබාදෙමින් කටයුතු කළ ද එ.ජා.ප නායකයා සම්බන්ධයෙන් දිගින් දිගටම අවවර්ධනාත්මක පුවත් විකාශනය කරනු නිරීක්ෂණය විය. එහෙත් ***සිරස*** නාලිකාව සජිත් ප්‍රේමදාස මහතා සම්බන්ධයෙන් ප්‍රවර්ධනාත්මක පුවත් නිරතුරුව විකාශය කරන බව නිරීක්ෂණය විය. ***දිවයින , රිවිර*** සහ ***මව්බිම*** පුවත්පත් ද එ.ජා.පය සම්බන්ධයෙන් අවවර්ධනාත්මක පුවත් බහුලව පළ කරනු නිරීක්ෂණය විය. ***ස්වර්ණවාහිනිය*** සෙසු නාලිකා සියල්ලටම වඩා වැඩි ප්‍රවර්ධනාත්මක පුවත් සංඛ්‍යාවක් එ.ජා.ප යට ලබාදී තිබූ අතර එහිදී අගමැතිවරයාට මෙන්ම මංගල සමරවීර සහ සාගල රත්නායක වැනි එහි නියෝජිතයන්ගේ අදහස්වලට වැඩි ඉඩකඩක් වෙන් කර තිබිණ. ***හිරු*** නාලිකාවේ පුවත් අන්තර්ගතය තුළ වැඩි වශයෙන්ම ප්‍රවර්ධනාත්මක පුවත් වෙන් කර තිබුණේ ශ්‍රී,ල.පො.පෙ ය. වගු අංක 1, 2 සහ 3 ප්‍රස්තාර අංක 1,6 සහ 7 මීට අදාළව කරුණු පුළුල්ව දක්වා ඇත.